මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/10** **2024.10.07**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

### සියලුම අපේක්ෂකයන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීමේ අවශ්‍යතාව

2024.11.14 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය තරග කිරීම සඳහා නාමයෝජනා භාර දෙනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල සියලුම අපේක්ෂකයින් විසින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80(1) (ප) , 82 (1) (ඊ), 82 (2), 89, 90 (4) වගන්ති අනුව ඡන්ද විමසීම් දිනය ප්‍රකාශයට පත් කළ දිනයට තමන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ අදාළ තේරීම්භාර නිලධාරී වෙත නාමයෝජනා පත්‍ර සමඟ භාර දිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එමෙන්ම 99 අ ව්‍යවස්ථාව අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර අපේක්ෂකයන් ද වත්කම් හා බැරකම් ප්‍රකාශ නාමයෝජනා පත්‍ර සමඟ කොමිෂන් සභාවට භාරදිය යුතු ය.

නාමයෝජනා පත්‍රය සමඟ වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර දීමට අපොහොසත් වීම දණ්ඩනයකට යටත් විය යුතු වරදක් බව දැනුම් දෙනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්